**ශීර්ෂය - 24 - ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම රු.3,487,279 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු. 3,014,879 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ලැබීම් රු. 472,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | අත්තිකාරම් ලැබීම් සියල්ල කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු. 2,515,056 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් රු.2,267,656 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ගෙවීම් රු. 247,400 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | අත්තිකාරම් ගෙවීම් සියල්ල කාර්යසාධන ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,315,633 ක් වුවද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.2,123,133 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 192,500 ක් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | අත්තිකාරම් ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.1,222,837 ක් වුවත් එම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | අග්‍රිම ශේෂය භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කිරීමේ අවශ්‍යතාවය. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තු පොත් අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් රු.74,360,000 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ අග්‍රිම ලැබීම රු.79,655,747 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 5,295,747 ක් වැඩිපුර දක්වා තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ ලද ආදායම් නොවන ලැබීම රු. 4,207,050 ක් වුවත් එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි. | -එම- | ආදායම් නොවන ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්විය යුතු වීමේ අවශ්‍යතාවය. |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම් රු.2,131,103ක් වුවත් එය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබීම හේතුවෙන් මුදල් ගලාජ්ම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | අත්තිකාරම් අයකර ගැනීම් වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමේ අවශ්‍යතාවය |
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව වර්ෂය තුළ අත්තිකාරම් අයකරගැනීම් රු.2,131,103ක් වුවත් එය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබීම හේතුවෙන් මුදල් ගලාජ්ම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | අත්තිකාරම් අයකර ගැනීම් වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්වීමේ අවශ්‍යතාවය |
| (ඉ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම් රු.2,267,656 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 1,225,250 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,042,406 ක් මුදල් ගලායාම් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | අත්තිකාරම් ගෙවීම්වල දළ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය. |

### 1.6.4 අග්‍රිම ගැලපුම් ගිණුම

-----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------------------- | |
| දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ලැබීම් , ගෙවීම් අතර වෙනස රු.1,108,776 ක් වුවත් එය අග්‍රිම ගැලපුම් ගිණුමට රු.883,776 ක් ලෙස ගැලපීම් කර තිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම මූලධන වැය විෂයයෙහි රු. 200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු සීමා කිරීම නිසා ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමේ කටයුතු කල් දැමීමට සිදුවූ අතර පසුව කොමිෂන් සභාව අහෝසි කිරීමට තීරණය වූ හෙයින් මිලදී ගැනීමේ කටයුතු නවතා දමන ලද බව. | ඇස්තමේන්තු ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය. |

### 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 2,315,633 ක් විය. එහෙත් දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ වූ සැසඳුම් ප්‍රකාශය [මු.රෙ. 427(1)] අනුව වර්ෂය අවසානයේ ශේෂය රු. 2,540,633 ක් විය. ඒ අනුව රු. 225,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වන බව දන්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව ශේෂය නිවැරදිව සටහන් කිරීමේ අවශ්‍යතාවය. |
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) අනුව 8493-0-0-024-0-12-0 (හරස් සටහන්) වර්ෂය තුළ බැර කිරීම් රු. 2,398,582 ක් විය. එහෙත් දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ වූ සැසඳුම් ප්‍රකාශයේ [මු.රෙ. 427(1)] භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය වර්ෂය තුළ හරස් සටහන් මඟින් බැර කිරීම් රු. 2,173,582 ක් විය. ඒ අනුව රු. 225,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 52) සහ ආකෘති පත්‍ර අංක ඒසීඒ - 5 අනුව 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 2,315,633 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව කේවල ශේෂ මුලු එකතුව රු. 2,540,633 ක් විය. ඒ අනුව රු. 225,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයන් 02 ක් සම්බන්ධයෙන් වටිනාකම රු. 48,892 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සටහන් අංක (iii) හි සඳහන් කර නොතිබුණි. | එකඟ වන බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුලින් බැරකම් සියල්ල හෙළිදරව් කළයුතු වීම. |
| (ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන (SA 92) අනුව 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු බැඳීම් හා බැරකම් වශයෙන් දක්වා තිබූ අයිතමයන් 02 ක වටිනාකම් සහ මූල්‍ය ප්‍රකාශයන්හි සටහන (iii) හි දක්වා ඇති වටිනාකම් අතර රු. 59,780 ක වෙනස්කම් පැවතුණි. | එම- | -එම-. |